# මෙන්න මැනිං වෙළඳපොළ

මැනින් වෙළඳ පොළ තුළ එළවළු සහ පලතුරු අලෙවිය සිදුවන්නේ තරඟකාරී ක්‍රමයකටය. සෑම තොග වෙළෙන්දෙකුම (කොමිස් වෙළෙන්දෙකුම) සෑම විටෙම උත්සාහ ගනු ලබන්නේ හැකි තරම් දුරට තමාගේ බඩු කොටස හැකි ඉහළම මිලකට අලෙවිකර ගැනීමටයි. මේ හේතුව නිසා ගොවියාට වැඩිවාසියක් සහ සහනයක් සිදුවේ. කොමිස් වෙළෙන්දට සැපයුම්කරුවන් හෙවත් ගොවියන් බඩු සපයන්නේ ඔහු කෙරෙහි පවතින සම්පූර්ණ විශ්වාසය පදනම් කරගෙනය. යම් හෙයකින් විශ්වාසය කඩවී ගියහොත් සැපයුම්කරුවා සහ කොමිස් වෙළෙන්දා අතර පවතින හොඳහිත සහ ගනුදෙනුව නැතිවී සෑම වැලැක්විය නොහැකිය. මෙම හේතුව නිසා කොමිස් වෙළෙන්දා තමාට ලැබෙන බඩු කොටස නිතරම වැඩි මිලකට අලෙවි කිරීමට උත්සාහ ගනියි. මෙම නිසා තරඟකාරී භාවය කොමිස් වෙළඳුන් අතර ඇතිවී තිබේ. කොමිස් වෙළෙන්දා සහ සැපයුම් කරුවා අතර පවතින මෙම ගනුදෙනුව සම්පූර්ණයෙන් විශ්වාසය මත පදනම් කරගෙන සිදුවන ගනුදෙනුවකි.

මැනිං එලවළු වෙළඳපොළ යනු එලවළු පලතුරු සහ වෙනත් පාරිභෝගික ද්‍රව්‍යයන්ගේ ප්‍රධාන අලෙවි මධ්‍යස්ථානයයි. කොළඹ මහ නගර සභාව මහින් පාලනය වනු ලබන මෙම වෙළඳපොළෙහි ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ එළවළු පලතුරු අලෙවියයි. කඩබක්කි එක්දහස් දෙසියකින් සමන්විත මෙහි කඩබක්කි 450ක පමණ එළවළු සහ පලතුරු තොග වෙළඳාම සිදු කරනු ලබන අතර අතිකුත් කඩබක්කිවල සිල්ලර වෙළඳාම සිදුකරනු ලැබේ. තවද මෙම වෙළඳපොල දිවයිනෙහි සෑම ප්‍රදේශයක් සහ නගරයක් සමගම සම්බන්ධතාවයක් පවතින ප්‍රසිද්ධ වෙළඳ ආයතනයකි. එවන් තත්ත්වයක් ඇතිවී තිබෙන්නේ ගොවීන් විසින් නිපදවනු ලබන එළවළු සහ පළතුරු එම පළාත්වලින් මෙම වෙළඳපොලට එවීමත්, මෙම වෙළඳපොලෙන් අලෙවි කරනු ලබන එම ද්‍රව්‍යයන් දිවයිනෙහි වෙනත් අලෙවි සැල් වෙත රැගෙනයෑමත් නිසාය. මෙම හේතුවෙන් මැනිත් වෙළඳපොල ගොවියන් වෙළඳුන්, පාරිභෝගිකයින් එක් කරන ස්ථානයක් වශයෙන්ද හැඳින්විය හැකිය.

කොළඹ සහ අවට ප්‍රදේශවල ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීමත් සමගම ජනතාවගේ එදිනෙදා පරිභෝජනය සඳහා වන එළවළු සහ පළතුරුවලද ඉල්ලුම සීඝ්‍රයෙන් වැඩිවීම සිදුවේ. තවද එළවළු අපනයනය කිරීම සහ සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනය නිසා සංචාරක හෝටල් සඳහාත් එළවළු සහ පළතුරුවල ඉල්ලුම තව තවත් වර්ධනය වීම රහසක් නොවේ. මේ සඳහා වන ප්‍රධාන සැපයුම් මධ්‍යස්ථානය බවට මැනිත් වෙළඳපොළ පත්ව ඇත. ඒ සඳහා අවශ්‍ය කරන එළවළු සහ පලතුරු දිවයිනේ බොහෝ පළාත්වලින් මෙම මධ්‍යස්ථානයට පැමිණීම දිනපතා සිදුවේ.

**මැනිත් මාර්කට් පොදුවෙළඳ සමිතියේ**
**ලේකම්**
**සාමවිනිසුරු**
**ගාමිණී හඳුන්ගේ විසිනි.**
**සකස් කළේ :**
**පී.එම්.එම්.පී. නයනදර්ශනී විසිනි.**

මෙම මධ්‍යස්ථානයට ලැබෙන මෙම නිෂ්පාදිත ද්‍රව්‍යයන් අලෙවි කිරීම සිදුවන්නේ කොමිස් පදනමක් මතය. වෙළඳපොලෙහි තොග වෙළඳුන් විසින් අලෙවි කරනු ලබන මෙම ද්‍රව්‍යයන් සඳහා 10%ක කොමිස් මුදලක් අයකරනු ලැබේ. මෙම වෙළඳුන් එළවළු අලෙවියේ දී ගනු ලබන ක්‍රියා මාර්ගය කෙසේද යන්න විමසා බලමු. වෙළඳුන් යම්

භාණ්ඩයක් සම්බන්ධව මිලක් නියම කළද කිසිදිනෙක එම මිලට ඔහුට එම භාණ්ඩය තමා සිතන අන්දමට අලෙවිකර ගැනීමට හැකියාවක්

දිවයිනෙහි පවතින නිෂ්පාදිත ප්‍රදේශවලින් මැනින් වෙළඳපොළට වැඩි වශයෙන් ලොරි මඟින් භාණ්ඩ ප්‍රවාහනය කරනු ලැබේ. එක් එක් ප්‍රදේශවල නිෂ්පාදිත භාණ්ඩ එම ප්‍රදේශයන්හි එකතු කරන මධ්‍යස්ථානවලට රැගෙන එන සැපයුම්කරුවන් තම භාණ්ඩ ලේබල ගත කොට එම භාණ්ඩ අසුරා ඇති ගෝනි සහ පෙට්ටිවල ලැබියයුතු කඩබක්කියෙහි අංකය සහ සලකුණු අකුරු සඳහන් කොට ලොරිවලට භාරදෙනු ලැබේ. එම ලොරි මඟින් වෙළඳපොළ තුළ ඇති ඒ ඒ ප්‍රදේශවලට සම්බන්ධ බඩුබාවත්තන්ගේ සමිති මඟින් අදාළ කඩබක්කිවලට කුලීකරුවන් මඟින් එම භාණ්ඩ භාරදීම සිදුකරනු ලැබේ.

නොලැබේ. එසේ වුවද කලාතුරකිනි. මෙම භාණ්ඩ සඳහා එදිනෙදා මිල නියම වන්නේ ගැනුම්කරුවන්ගේ ම ක්‍රියාමාර්ගය තුළින් යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. උදාහරණයක් වශයෙන් වෙළඳ මහතා රුපියල් පහකට මිරිස් කිලෝවක් මිල කළද ගැනුම්කරුවා විසින් එය රුපියල් හතරකට ඔහුගෙන් ඉල්ලීමට පුළුවන. එවැනි ගැනුම්කරුවන් තුන් හතර දෙනෙකු එම මිලටම ඔහුගෙන් එය ඉල්ලා සිටියහොත් එදින මිල රුපියල් 4 ලෙස තීරණය කෙරේ. එයට හේතුවක් වන්නේ ගැනුම්කරුවා වෙළඳපොලෙහි සෑම තැනම ඇවිද විපරම්කර බලා නිගමනය කරනු ලබන මිල නිසා ඔහු එම තත්ත්වයට පත්වන්නේ අනිකුත් කඩවල මිලගණන් සහ වෙළඳපොලට එදා පැමිණි භාණ්ඩ කොටස දෙස තියුණු ඇසකින් විපරම්කර බලා ගන්නා තීරණය තුළිනි. මේ අනුව කොමිස් වෙළෙන්දන්ට තමන් සිතන අන්දමට භාණ්ඩයක් මිල කිරීමට ලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. ඒ සැපයුමට වඩා ඉල්ලුම වැඩිවූ දිනක පමණි.

මැනිං වෙළඳපොල තුළ එළවළු සහ පලතුරු අලෙවිය සිදුවන්නේ තරඟකාරී ක්‍රමයකටය. සෑම තොග වෙළෙන්දෙකුම (කොමිස් වෙළෙන්දෙකුම) සෑම විටෙම උත්සාහ ගනු ලබන්නේ හැකි තරම් දුරට තමාගේ බඩු කොටස හැකි ඉහළම මිලකට අලෙවිකර ගැනීමටයි. මේ හේතුව නිසා ගොවියාට වැඩිවාසියක් සහ යහපතක් සිදුවේ. කොමිස් වෙළෙණ්දාට සැපයුම්කරුවන් හෙවත් ගොවියන් බඩු සපයන්නේ ඔහු කෙරෙහි පවතින සම්පූර්ණ විශ්වාසය පදනම් කරගෙනය. යම් හෙයකින් විශ්වාසය කඩවී ගියහොත් සැපයුම්කරුවා සහ කොමිස් වෙළෙන්දා අතර පවතින හොඳහිත සහ ගනුදෙනුව නැතිවී යෑම වැළැක්විය නොහැකිය. මෙම හේතුව නිසා කොමිස් වෙළෙන්දා තමාට ලැබෙන බඩු කොටස නිතරම වැඩි මිලකට අලෙවි කිරීමට උත්සාහ ගනියි. මේ නිසා තරඟකාරී භාවය කොමිස් වෙළඳුන් අතර ඇතිවී තිබේ. කොමිස් වෙළෙන්දා සහ සැපයුම්කරුවා අතර පවතින මෙම ගනුදෙනුව සම්පූර්ණයෙන් විශ්වාසය මත පදනම් කරගෙන සිදුවන ගනුදෙනුවකි.

දිවයිනෙහි විවිධ පළාත්වල සිටින සැපයුම් කරුවන් විසින් වෙළඳපොලෙහි ඒ ඒ කඩබක්කිවල සිටින කොමිස් වෙළඳුන් සඳහා ප්‍රවාහනය කරනු ලබන භාණ්ඩ භාරගෙන අලෙවිකර එම මුදලෙන් ප්‍රවාහන ගාස්තු කොමිස් ගාස්තු බෑවුම්කුලී යනාදිය අඩුකොට ඉතිරි මුදල් සැපයුම්කරුගේ භාණ්ඩ සඳහා 10%ක කොමිස් මුදලක් අයකරනු ලැබේ. කොමිස් වෙළෙන්දා සාමාන්‍යයෙන් භාණ්ඩ තොග වෙනුවෙන් වෙළඳපොලෙහි සැපයුම්කරු නියෝජනය කිරීම මිල සහ වෙනත් කරුණු සම්බන්ධව තීරණ ගැනීම තමාට ලැබෙන භාණ්ඩ තොග සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීම, ප්‍රවාහන ගාස්තු ගෙවීම, යම් හෙයකින් භාණ්ඩ ඉතිරිවූවහොත් ඒවාට ආරක්ෂාව සැලසීම, සැපයුම්කරුවන්ගේ මුදල් අවශ්‍යතාවයන් සපුරාලීම, සෑම විටෙකම භාණ්ඩ සම්බන්ධ වන වගකීම

දැරීම යනදෑ සිදුකරයි. තවද තමාගේ පෞද්ගලික කටයුතු සහ ගොවිකටයුතු සඳහා කොමිස් වෙළෙන්දා නිතරම බැඳීමකින් තොරව සැපයුම්කරුගේ අවශ්‍යතා සපුරාලීම සඳහා මුදලින් ආධාර කරයි. තව ද මෙම එළවළු සහ පලතුරු ප්‍රවාහනය සඳහා සැපයුම්කරුවනට අවශ්‍ය කරනු ලබන ඇසුරුම් භාණ්ඩ වන ගෝනි පෙට්ටි යනාදිය ද කොමිස් වෙළෙඳා විසින් සපයා දෙනු ලබයි. සැපයුම්කරුගේ භාණ්ඩ සඳහා වන මුදල් ද ඔහුගේ අභිමතය පරිදි කිසිදු අපහසුතාවයකින් තොරව ආරක්ෂාකාරීව ඔහුට ලැබෙන්නට සලස්වනු ඇත.

දිවයිනෙහි පවතින නිෂ්පාදිත ප්‍රදේශවලින් මැනිං වෙළඳපොලට වැඩි වශයෙන් ලොරි මගින් භාණ්ඩ ප්‍රවාහනය කරනු ලැබේ. එක් එක් ප්‍රදේශවල නිෂ්පාදිත භාණ්ඩ එම ප්‍රදේශයන්හි එකතු කරන මධ්‍යස්ථානවලට රැගෙන එන සැපයුම්කරුවන් තම භාණ්ඩ ලේඛන ගත කොට එම භාණ්ඩ අසුරා ඇති භෝග සහ පෙට්ටිවල ලැබියයුතු කඩබක්කියෙහි අංකය සහ සළකුණු අකුරු සඳහන් කොට ලොරිවලට භාරදෙනු ලැබේ. එම ලොරි මගින් වෙළඳපොළ තුළ ඇති ඒ ඒ ප්‍රදේශවලට සම්බන්ධ බඩුබාවන්නන්ගේ සමිති මගින් අදාළ කඩබක්කිවලට කුලීකරුවන්මගින් එම භාණ්ඩ භාරදීම සිදුකරනු ලැබේ.

බඩු ප්‍රවාහනයේදී බොහෝ අවස්ථාවල නොයෙකුත් දුෂ්කරතාවන්ට සහ අපහසුතාවන්ට මුහුණපෑමට සිදුවන අතර නාස්තියද විශාල ලෙස සිදුකරන බව ප්‍රකාශ කළ යුතුව ඇත. ලොරි ප්‍රමාදවී වෙළඳපොලට පැමිණීමෙන් එම බඩුවලට ඇතැම් අවස්ථාවලදී නියමිත මිලත් නොලැබී යනු ඇත. බඩු ප්‍රවාහන ලොරිවල කාර්මික දෝෂයන් සිදුවූ අවස්ථාවලදී එම බඩු එදිනට වෙළඳපොලට නොලැබී යෑමෙන් බලවත් ලෙස නාස්තිවනු ඇත. එවැනි තත්ත්වයක් ඇතිවූ අවස්ථාවලදී එහි පාඩුව වැඩි වශයෙන් දැරීමට සිදුවන්නේ සැපයුම්කරුවනටය. ඇසුරුම්කරණයේදී සහ ප්‍රවාහනයේදී සිදුවන වැරදි නිසා එළවළු සහ පලතුරු විශාල වශයෙන් නාස්තියට ලක්වන අවස්ථා ඇත. මේ අයුරින් ලොරිවල බඩු පැටවීමේදී සැපයුම්කරුට පාඩු සිදුවන අවස්ථාවක් උදාහරණයක් වශයෙන් මෙසේ ගෙනහැර දැක්විය හැක. අම්බලන්ගොඩ සිට එලවළු පටවාගෙන එන ලොරියක දිවුල් අඩංගු ගෝනි සමඟ අළුකෙසෙල් පටවාගෙන පැමිණිය විට එම කෙසෙල් වෙළඳපොල තුළට පැමිණෙන විට බොහෝ සේ ඉදී පවතී. සැපයුම්කරුවන් ඇතැම් අවස්ථාවලදී ලොරි කුලී පිරිමසා ගැනීම සඳහා මේ අයුරින් බඩු එවීම සිදුකෙරේ. පතෝල කිලෝ 50-60ක් පමණ අඩංගුවන සේ මිටි සකස් කර එවීමෙන් එහි පවතින අධික බර ප්‍රමාණය නිසා ඇහෙන ප්‍රමාණයක් තැලී පොඩිවී යනු ඇත. තක්කාලි වැනි පහසුවෙන් පොඩිවී යන ද්‍රව්‍යයන් එවීමේදී ඒ සඳහා සුදුසු ඇසුරුම් කරණයක් නොමැතිවීමෙන් බොහෝ සේ ඒවා නාස්තිවී යනු ඇත. බඩු ප්‍රවාහනයේදී ඒ සඳහා සුදුසු ඇසුරුම්කරණ පිළිවෙළක් සොයා ගැනීම දුෂ්කරවී ඇත. මේ හේතුව නිසා නාස්තිය පිටුදැකීම අපහසුවී ඇත. බොහෝ පළාත්වල එකම වාරයකදී එකම වර්ගයේ එළවළු එලදාව හටගනී. මේ හේතුවෙන් එකම වර්ගයේ එළවළු වෙළඳපොලට වැඩි වශයෙන් ලැබීමට පටන්ගනී. අලෙවිකර ගැනීමට නොහැකි අන්දමින් මෙසේ බඩු ලැබීමෙන් එම ද්‍රව්‍ය නරක් වී ඉවත දැමීමට සිදුවන වාර අනන්තය. උදාහරණ වශයෙන් වට්ටක්කා එලදාව ඇතිවන කාලය තුළ දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම වට්ටක්කා වෙළඳපොලට ලැබේ. බඩු වැඩිවීම නිසා ඉල්ලුම අඩුවීමෙන් මිල පහත වැටෙන අතර එම බඩු අලෙවිකර ගැනීමට නොහැකිවීමෙන් නරක්වී ඉවත දැමීමට සිදුවේ. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ එළවළු කල් තබා ගැනීමේ ක්‍රමයක් නොමැති කමයි. මේ සඳහා සුදුසු පිළියමක් යොදා ගැනීමට අපහසුවී ඇත.

මේ අයුරින් මැනිං වෙළඳපොල තුළට එළවළු සහ පලතුරු අලෙවිය මෙසේ සිදුවන අතර වෙළඳපොල තුළ අලෙවිකරණයෙහි යෙදී සිටින වෙළඳමහතුන් නිතරම පාරිභෝගිකයාට සාධාරණ මිලකට එළවළු ලබාගැනීමට සලසා දීමට උත්සාහකරන අතර විශේෂයෙන් එළවළු පලතුරු සපයා එවන ගොවියාට සහ සැපයුම්කරුවාට වාසිදායක මිලක් ලබා දීමට උත්සාහ කරයි.